# ඉලුක්හේන සාන්ත බෙනදිකානු සංඝය (ශ්‍රී ලංකා)

## ශු.සභාවේ හා ලෝකයේ ආරාමීය පැවිදි ජීවිතය හෙළිදරව් වීම.

**<u>ෆාර්ෆාහී සාන්ත බෙනදිකානු තාපසාරාමය (ඉතාලිය)</u>**

**<u>ඉලුක්හේන සාන්ත බෙනදිකානු සංඝය (ශ්‍රී ලංකා)</u>**

# ශු.සභාවේ හා ලෝකයේ ආරාමීය පැවිදි ජීවිතය හෙළිදරව් වීම.

# <u>පෙරවදන</u>

මෙම කුඩා පොත් පිංච නිර්මාණය කිරීම තුළ අප බලාපොරොත්තු වන්නේ, කෙටි පැහැදිලි කිරීමක් තුළ බොහෝ පිංතූර සමග පැවිදි සංඝයන්ට හා පවුල්වලට අධ්‍යාත්මික පණිවිඩයක් ලබා දීමය. මුළු මිනිස් ජීවිතයම ක්‍රිස්තුස් වහන්සේගේ අභිරහස මගින් ජීවමාන කර ඇති නමුත් එම අභිරහස අපගේ එදිනෙදා යථාර්ථවාදී ජීවිතය තුළ විනිවිද දකින්නේ කෙසේද? පැවිදි සංඝයන් සියවස් ගණනාවක් පටන් මෙම පැනයට පිළිතුරු සපයා ඒවා ආරක්ෂා කර ඇති අතර වෙන කවරදාටත් වඩා අද ඒ පිළිඳව පැවිද්දන් වැඩි වැඩියෙන් අවදානය යොමු කළ යුතුය.එමෙන්ම ඒවා දේව ජනතාවගේ දෛනික ජීවිතය මත පතුරුවන්නට හා අනුගත වන්නට ඔවුන් දිරිමත් කළ යුතුය. තවද විශේෂයෙන්ම නිවසේ බිත්ති අතර සිදුවන නිහතමානී, සැඟවුණු ජීවිතය හා සියලු මිනිස් පැවැත්ම සඳහා කේන්ද්‍රීය භූමිකාව වන පවුල් සංස්ථාව වර්තමානයේ අත්දකින වේදනාකාරී තත්වයන් නිසාම නැවත එදා පැවිදිවරුන් විසින් සොයාගත් ඒ අධ්‍යාත්මික පිළිතුරු සමග වත්මන් පවුල් ජීවිතය මෙන්ම පැවිදි ජීවිතය ගොඩ නගන්නට හා ක්‍රිස්තු අභිරහස තුළ ජීවමානවූ මිනිස් ජීවිතය දේව වටිනාකම් තුළ ගොඩනගන්නට යම්කිසි මගපෙන්වීමක් ලබා දීමට මෙමගින් අවධානය යොමුකර ඇත.

## <u>දේව මන්දිරයේ(දේවස්ථානයේ) හා පූජක ධූරයේ(පූජකත්වයේ) අභිරහස්මක පැවැත්ම</u>

**මිනිස් ජීවිතය එදිනෙදා අවශ්‍යතාවයන් හා ඕනෑ එපාකම් හා ආරක්ෂාව යන කරුණු කාරණා නිසාවෙන් දෛනිකව අසහනකාරී පීඩාකාරී තත්වයකට පත්ව ඇත. එදා ඊශ්‍රායෙල් ජනතාවද මෙම අත්දැකීම්වලට ඇතුල්ව සිටියේය. එදා ඔවුන් දිව්‍ය ආලෝකයෙන් තම ආත්මය හා පැවැත්ම ආලෝකවත් කර ගැනීම සඳහා ජෙරුසලෙම් දේව මාලිගයට වෙත ගමන් කළාය. අපද අද ජීවමානව දෙවියන් වහන්සේ වැඩ සිටින දෙව්මැදුර තුළදී අපගේ ජීවිත අලෝකවත් කර ගත යුතුය. පූජකයා වනාහී ලෞකීක දෙයින් අත්මිදී ලෝකෝත්තර දේ උදෙසා දිවි කැපකළ දේව සේවකයෙකි. ඔහු දෙවියන් වහන්සේ ඉදිරියේ දේව ජනතාව උදෙසා යාච්ඤාවේ හා නමස්කාරයේ යෙදී සිටියහ. අදත් පූජක කාර්‍ය තුළ පූජක ආලේපය ලබා ඇති සියල්ලන් ඒ සඳහා කැඳවා ඇත.**

2 ගීතාවලිය 84



භක්තිමත් ඊශ්‍රායෙල් ජනතාව දේව මාලිගයට වන්දනා චාරිකාවක යෙදෙමින් මෙසේ මොරගැසූහ:

1 සව් බලැති දෙවිඳුනි,

ඔබේ වාසභවනය

කොතරම් මනහර ද?

2 මසිත සමිඳුන්ගේ මන්දිර දෙස

**දැවෙන අශාවෙන් බලා සිටියි.**

**මාගේ ගත සිත**

**ජීවමාන දෙවිඳුන්ට**

**ප්‍රීතියෙන් ගී ගයයි. (.......)**

**4 ඔබේ ගෘයෙහි වසන්නෝ**

**කොපමණ වාසනාවන්ත ද?**

**ඔව්හු නිරතුරු**

**ඔබට පසස් ගී ගයන්නෝය.**

***(ගීතාවලිය 84)***

***ඔබේ රජ මැඳුරෙහි වසන පිණිස ඔබ තෝරාගත් තැනැත්තා කොපමණ වාසනාවන්ත ද?***

***ඔබේ දෙව් මැදුර වන ඔබේ නිවෙසෙහි යහපත් දෙයින් අප සෑහීමට පත් කළ මැනව.***

***ගීතාවලිය 65)***

## .....“මේ දේව මාලිගාව කඩාදමන්න, තෙදිනකින් මම එය නැවත ගොඩනගන්නෙමි”...... (ජුවාම් 2:19)

දේව මාලිගාව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් ගැඹුරින් අලුත් කළ යුතුව තිබුණි. එය අධ්‍යාත්මිකව නවතාවයකට පත් කිරීමකි. ජේසුස් වහන්සේව ප්‍රථම වතාවට දේව මලිගාවේ කැප කිරීමට ගෙනා අවස්ථාවේ, ශුද්ධවූ මන්දිරය තුළ ශුද්ධවූ පවුල සිටීම නව ජෙරුසලමේ දේව මාලිගය කුමක් විය හැකිද, කෙසේ විය හැකිද යන්න ඉස්මතු කර පෙන්වීය. ඒ අනුව එහි සාන්තුවරයන්ගේ සාන්තුවරයා පාරිශුද්ධ දේව මාතාවන් සමග ජේසුස් වහන්සේම වන්නට ඇත.


Poussin

## දේව මාලිගාව විසින් අළුත් කරන ලද මිනිස් ජීවිතය ලෝක ජීවිතයේ විහිදීම බවට පත්විය.


වර්තමානයේ එම දේව මාලිගාවේ ස්වාමිවරුන් වන්නේ, ස්වර්ගීය පියාණන් වහන්සේ සමග නව මිනිසා වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේත්, නව කාන්තාව වූ මරිය තුමියත්ය.ඔවුන් එසේ ජීවත් වන්නේ ලෞකික සැප සම්පත් උරුම කර ගැනීම සඳහා නොව දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ රාජ්‍යය මෙලොව සීමාන්තයන් දක්වා ව්‍යාප්ත කිරීමටය. ඇදහිලි වන්තයන් ඔවුන්ගේ මගපෙන්වීම තුළ සැබෑ දේව මාලිගාවේ ආලෝකය, අධ්‍යාත්මය තම නිවෙස්වල හා වීදිවල තම ජීවිතාදර්ශය තුළ බැබළවිය යුතුය.

"පණිවිඩය අසා, මේ ජීවිතයේ කරදරවලින්ද වස්තු මායාවෙන්ද පණිවිඩය යටපත් වීම නිසා, කෙනෙක් පළ නොදරති....." *(මතෙව් 13:22)* මෙසේ මිනිසා බොහෝ ඉක්මන් තීරණ ගැනීම තුළ දේව මාලිගාවේ සැබෑ ආලෝකය ලෝකයට ලබා දීමට අපොහොසත් වන අවස්ථාද එමටය.



**<u>“…… ඈ දේව මාලිගාවෙන් අහක්ව නොගොස් දිවා රෑ දෙකේහි උපවාස හා යාච්ඤා පවත්වමින් නමස්කාර කළාය.” *(ලූක් 2:37)*</u>**

සුභාරංචිය පවසන වැන්දඹුව අන්නා, ගිහි කාන්තාවක් වූ නමුත් ඇගේ මුළු ජීවිතයම දේව මාලිගාවේ ආලෝකය තුළ ගිලී තිබුණාය. ඇය පූජකයින් නොවන කැපවුණු ජීවිතවල ප්‍රතිරූපය හා ආදර්ශයයි. සමහරක් පූජකයින් බවට පත්වේ. නමුත් බෞතිස්ම ස්නාපනය ලබන සියල්ලන් දෙවියන් වහන්සේගේ වචනය කටු පඳුරු අතර වැටුණු බීජ මෙන් නොව සරු බිමෙහි වැටුණු බීජ මෙන් විය යුතුය. එබවින් ලෞකිකත්වය අභිබවා ගිය සාංඝික ජීවිතයක් ගොඩ නගා ගත යුතුය. ඒ සඳහා දෙවියන් වහන්සේගෙන් මිනිසාට ලැබුණු උතුම් දීමනා තුනක් ඇත. ඒවා නම් ආදරය, බලය හා නිදහස වේ. මේවා මිනිසාව දෙවියන්ගෙන් ඈත් කරන ප්‍රබල පාප පරික්ෂාවන් බවද අප සිහි තබා ගත යුතුය. නමුත් මේවා නැවත ඒවායේ දිව්‍යමය ස්වාභාවයට ගෙන ඒම සඳහා නිර්මලකම හෙවත් ව්‍රතශුද්ධිය, දිළිඳුකම සහ කීකරුකම යන උතුම් වේදභාරයන් අනුගනය කළ යුතුය.





## "අමුත්තන් ලෙස පැමිණෙන සියල්ලන් ක්‍රිස්තුස් වහන්සේ මෙන් සළකා සාදරයෙන් පිළිගත යුතුය" *(සාන්ත බෙනඩික් තුමන්ගේ නීතිය 53 පරිච්ඡේදය)*

කැපවීම හා කැපකිරීම් මත බිහිවන සාංඝික ජීවිතය මිනිස් ජීවිතයේ මූලික ආදර්ශයක් වන අතර එය ලෞකීක අවශ්‍යතා අරමුණු කර නොගත් දේව ආදරය තුළ ජීවත් වෙමින් එම ආදරය ලෝකය පුරා ව්‍යාප්ත කිරීම උදෙසා කැපවූ අධ්‍යාත්මික ජීවිත ක්‍රමයකි. දේව ආදරය මූර්තිමත් කරන සාංඝික ප්‍රජාවන් එදිනෙදා ජීවිත ක්‍රමය තුළින් දෙවියන් වහන්සේගේ ආලෝකය ලෝකයට ගෙන එයි. බෞතීස්ම කැඳවීම තුළ පූජක කැඳවීමට හිමිකම් කියන පූජක නොවන පැවිදිවරුන් (පැවිදි සහෝදර සහෝදරියන්) ලෝකයේ පුරුෂයින්ගේ හා ස්ත්‍රීන්ගේ ආදර්ශයන් පසෙකලා  ක්‍රිස්තුස් වහන්සේ හා මරිය තුමියගේ ආදර්ශය තුල තම කැඳවීමට සාක්ෂි දැරිය යුතුය.

මෙසේ ස්වාමිපුරුෂයෙක්, භාර්‍යාවක් හා දරුවන් ලෙසද ගිහි පූජකත්වය දේව මාලිගාව හෙවත් ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය තුළ ලෝකයට ගෙනෙන්නට තම පවුල හා එදිනෙදා ජීවිත ක්‍රමය තුල හැකියාවක් පවතී. ස්වාමිපුරුෂයාට ක්‍රිස්තුස් වහන්සේ විය හැකිද? භාර්‍යාවට මරිය තුමිය මෙන් විය හැකිද? දරුවන්ට කායික ජීවිතයකට එහා ගිය ආත්මීක ජීවිතයක් දේව ආදරය තුළ දෙමාපියන්ට ලබා දිය හැකිද?

සැබවින්ම දෙමාපියන්, දරුවන් ලෙස ක්‍රිස්තුස් වහන්සේ හා මරිය තුමිය ඔහුන්ගේ ආදර්ශය කරගන්නා තාක් සහ එය ඔවුන්ගේ සිතෙහි රඳා තිබෙන තුරු අනුකරණය කිරීමට, ජීවත් කිරීමට හා අන් අයට ඉගැන්වීමට හැකිය.මෙම නිසාම කැපවුණු ආරාමීය පැවිදි සංඝයන් විසින් පාරිශුද්ධ ජීවිතය පිළිබඳව හොඳම ජීවිතාදර්ශය, තම ආගන්තුක සත්කාර, ඉගැන්වීම් හා අධ්‍යාත්මීක අදර්ශයන් ගිහි පවුල්වලටද ආදර්ශයට ගත හැකි අයුරින් තව තවත් වර්ධනය කර ගත යුතුය.




foresteria
monastica



## පුරුෂ හා ස්ත්‍රී පූජකත්වය

ගිහි පූජකත්වය පුරුෂයින් හා ස්ත්‍රීන් තුළ විවිධාකාරයෙන් ප්‍රකාශ වේ. ක්‍රිස්තුස් වහන්සේ පුරුෂ පූජකත්වයේ ආදර්ශය හා ප්‍රතිමූර්තිය වේ. එතුමන් තම පුරුෂ අභිමානය සහ බලය සඳහා කැදරකම තම සහකාරිය වූ දෙවියන් වහන්සේ සමග ප්‍රේමයෙන් හා සාංඝිකව ජීවත් වීමේ අරමුණින් කැප කළාය. දේව මාතාවන් වහන්සේ කාන්තා පූජකත්වයේ ආදර්ශය හා ප්‍රතිමූර්තිය වේ. එතුමිය තම අභිලාෂයන් හා නිෂ්ඵල දෙය අත්හැර, එමගින් දෙවියන් වහන්සේගේ දාසියක්වී තම ආත්මීක ස්වාමිපුරුෂයානන් වූ ශුද්ධාත්මයානන් සමග අවංකව ඒකාබද්ධ වීම තුළ දේව පුත්‍රයානන් මෙලොවට ගෙන ඒමට එතුමියගේ ආදරය, විශ්වාසය ඉමහත් විය. තවද එතුමිය සියළුම දරුවන් කෙරෙහි දක්වන්නාවූ ප්‍රේමයේ ආලෝකය තුළ තම දරුවන්ගේ සැබෑ ප්‍රතිමූර්තිය හඳුනා ගැනීමට හැකිය.

ප්‍රධාන කොට මෙම පූජකත්වය නිවස තුළ ක්‍රියාත්මක නොවන්නේනම් වෙන කිනම් ස්ථානයක ක්‍රියාත්මක වන්නද? එම නිසා නිවස දේව ගෘහයක් බවට පත්විය යුතුමය. සාන්ත බෙනඩික් තුමන් පවසන පරිදි නිවස හෙවත් දේව ගෘහයේ වසන කිසිවෙක් කරදරයට පත් නොවිය යුතුය. “....දෙවිඳුන්ගේ නිවසෙහි වසන කිසිවෙකු ව්‍යාකූලත්වයට හෝ ශෝකාකූලබවට පත්නොවන පරිදිය.” *(සාන්ත බෙනඩික් තුමන්ගේ නීතිය 31 පරිච්ඡේදය)*


මෙයින් අදහස් කරන්නේ නිවස තුළ සිදුවන සෑම කාර්යයක්ම ඉතාමත් වටිනා දෙයක් වන අතර ඒ සඳහා සෑම කෙනෙකුගේම දායකත්වය ස්වාමිපුරුෂයා භාර්යාව ලෙසත්, දුව පුතා ලෙසත් ලබා දිය යුතු බවයි. එමගින් සාංඝික ප්‍රේමය ඇතිවන බවයි. බෙනදිකාන පුරුෂ තාපස සංඝයන් වෙත සාන්ත බෙනඩික් තුමන් පවසා සිටියේ දේව දරුවන්ගේ ගුණධර්ම ප්‍රධාන වශයෙන් දේව ආදරය, වන්දනාව තුල පදනම් විය යුතු බවයි. " සාන්ත බෙනඩික් තුමන්ගේ නීතිය 04 පරිච්ඡේදය"


අපගේ නිවාස දෙවියන් වහන්සේ වැඩසිටින දේව ගෘහයක් බවට පත් කිරීම සඳහා නිවසේ බිත්ති අතර ජීවත් වන නිවැසියන්ගේ කැපවීමේ වටිනාකම වැදගත්කම නැවත විශේෂාකාරයෙන් සිතා බැලීමට වත්මන් සාමාජ තත්වය වෙන කවරදාටත් වඩා අපව යොමු කරයි. පැවිදි සංඝයන් මේ සඳහා ඔවුන්ගේ ජීවිතාදර්ශයන් මගින් පෙන්නුම් කර සිටින්නේ එම දෙවියන් වහන්සේ හා අනෙකා වෙනුවෙන් කැපවීම සමස්ත සමාජයටම කෙසේ බලපෑමක් එල්ල කරීමට හැකිදැයි කියාය. "Economy" යන වචනයේ මුල් ග්‍රීක් අරුත වන්නේ අන් කිසිවක් නොව "OIKOS NOMIA", එනම්, OIKOS = නිවස, NOMIA = නීතිය. එමනිසා "Economy" යන වචනයේ මූලික තේරුම: ගෘහාශ්‍රිත ජීවිතය සම්බන්ධයෙන් නිවැරදි නියාමනය වේ. නීතියක්, නියාමනයක් නොමැතිව කිසිවක් පතින්නේ නැත.


ඔබ හොඳින් සිතන්නේ නම්, ගෘහාශ්‍රිත පවුල් ජීවිතය නිසි ලෙස නියාමනය කරන්නේනම් එහිවූ අයවලුන්ගේ ජීවිත අඳුරු හා නින්දිත ක්‍රියාවන් සඳහා යොමු නොකරයි. ප්‍රථමයෙන්ම, විශාල කැපවීම හා ශාරීරික වෑයම කිසිසේත් නින්දිත නොවේ. තවද ඊට ප්‍රතිවිරුද්ධාත්මකව එහි ආපසු හැරවිය නොහැකි අධ්‍යාපනික හා ස්වයං අධ්‍යාපනික වටිනාකමක් ඇත. මන්දයත් එය අපට අපගේ ශරීරය, අපගේ හැඟීම් හා අපගේ අත්මාර්ථකාමී ප්‍රවණතාවයන් ගැන අපවම ස්වාමියා බවට පත් කිරීමට පුරුදු කරන බැවිනි. අප මේවාට එරෙහිව අත්හැරීම හෙවත් ස්වයං-ප්‍රතික්ෂේප කිරීමේ ස්වාභාවයකින් යුතුව කටයුතු කරන්නේනම්, එය ක්‍රිස්තුස් වහන්සේගේ මිදීමේ පූජාව සමඟ අපව සම්බන්ධ කරයි. එපමනක් නොව, නිවසේ (දෙවියන් වහන්සේගේ ගෘහය) රැකවරණය සඳහා වඩාත් නිහතමානී හා ශක්තිමත් පදනමක් අවශ්‍ය වේ. එය ද්‍රව්‍යමය දේ මගින් පමණක් ඉටු කරගත නොහැකිය. ප්‍රධාන වශයෙන් යාච්ඤාවේ බලය ඒ සඳහා අත්‍යවශ්‍ය වේ. පොදුවේ හා පෞද්ගලිකව යාච්ඤා කරන ස්ථානයන් හා ඒ පිළිවෙළ පිළිබඳව පැවිදි සංඝයන් පවුල් සඳහා ආදර්ශයක් විය යුතුය. අවාසනාවකට මෙන් නූතන පවුල්වලට මේ පිළිබඳව නිසි මගපෙන්වීමක් නොලැබීම හේතුකොටගෙන, ඔහුන්ගේ යාච්ඤා ජීවිතය පිරිහීමට ලක්ව ඇති පමණකුත් නොව යාච්ඤා ජීවිතය වර්ධනය කරගැනීමට කිසිදු උනන්දුවක් නොදක්වන අතරම ආගමික පොත පත පරිශීලණය කිරීමට, ශුද්ධ ලියවිල්ල හා සභා සංගීතය ගැන මෙන්ම සභා ගෘහ නිර්මාණ කලාව ගැන දක්වන නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීමට පෙළඹවී ඇත. ඒ හේතුවෙන් විශේෂයෙන් පැවිදි සංඝයන් තම


අවධානය මේ පිළිබඳව යොමු කොට ඔවුන්ගේ ජීවිතාදර්ශය තුළ නූතන පවුල් ඒ සඳහා යොමු කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කළ යුතුය.


නිවැරදි මගපෙන්වීම හා නිසියාකාර අර්ථාන්විත යාච්ඤාවන් මගින් පොදු හා පෞද්ගලික ලෙස භේදයක් නොමැතිව දේව ආලෝකය, ආදරය ගලා යන අතර, එය පියා, මව සහ දරුවන් යන සියල්ලන්ම ගිහි පූජකත්වයේ හවුල්කරුවන් බවට පත්කර ඔවුන්ගේ නිවස සැබෑ "දෙවියන් වහන්සේගේ ගෘහයක්" බවට පත් කරනු ඇත.











<u>**ඔබගේ නිවසේ වාසය කරන්නා භාග්‍යවන්තයෙකි: සෑම විටම ඔබගේ ප්‍රශංසාව ගායනා කරන්න!**</u>


**දෙවනුව නොව නිසැක වශයෙන්ම යාච්ඤාවේ මූලික පැතිකඩයක් ගායනාව හෙවත් ගැයීම වේ. පාවුළු තුමන් පවසන පරිදි: "ක්‍රිස්තුස් වහන්සේගේ දහම් පණිවුඩය ඔබ තුළ සියළු ප්‍රඥාවෙන් සමෘද්ධව පවතීවා. එකිනෙකාට ඥානවන්ත ලෙස අවවාදනුශාසනා කරන්න. ගීතිකාවලින්ද, ගායනාවලින්ද, ශුද්ධ ගීවලින්ද සිතෙහි ස්තූතිවන්තකමින්ද දෙවියන් වහන්සේට ගායනා කරන්න." *(කොලොස්සි 3:16)***

**නූතනයේ කොතරම් දෙනෙක් පාවුළු අපෝස්තුළු තුමන්ගේ මෙම අනුශාසනාව තම ජීවිතයේ පුරුදු පුහුණු කරනවාද? පැවිදි සංඝයන් විශේෂයෙන් මෙය අනුගමනය කිරීමට මුළු ශක්තියෙන් කැපවිය යුතුය. එසේම එමගින් නිසි මගපෙන්වීමක් හා පුහුණුවක් පවුල් සඳහා ලබා දීමට කටයුතු කළ යුතුය.**

**පාවුළු අපෝස්තුළුතුමන් වඩා හොඳම හෝ නරකම ලෙස ගායනය කරන්නේ කෙසේද කියා නොපවසයි. නිසැකවම ගායනය තුළ ආත්මයක් සැනසීමට හැකි වන්නේ එය නිවැරදි අයුරින් ගායනා කළහොත් පමණකි. එහි තේරුම වන්නේ ගායනය සඳහා අඛන්ඩ පෙර සූදානමක් හා දැඩි කැපවීමක් තිබිය යුතු බවයි.**

**මෙමගින් සංගීතය හා ගායනය පවුල, පැවිදි සංඝය තුළ යාච්ඤාව සඳහා පමනක් නොව, තම විවේක කාලය පවුලේ, සංඝයේ සාමාජිකයින් සමග විනෝදයෙන් ගත කිරීම**

**සඳහාද යොදා ගත හැකිය. ඛේදජනක ලෙස වර්තමානයේ සංගීතයේ හා ගායනයේ ලාලිත්‍ය පරිහානියට හා කෙලසීමට ලක්ව ඇත. ඒ කෙසේවුවත් සංගීතයේ හා ගායනයේ ඇති ලාලිත්‍ය, වැදගත්කම ආරක්ෂා කර ගැනීමට පවුලක්, සංසයක් ලෙස මෙය පෙළ ගැසිය යුතුම කාලයකි.**







**<u>“සහෝදරයන් එකිනෙකාට සේවය කළ යුතු අතර, රෝගී බව නැතහොත් අයෙකුට වෙනත් ස්ථානයක් වඩා ඵලදායී සේවයක් ඉටුකිරීමේ අවස්ථාව හැකිවිටකදී හැර කිසිවකු මුළුතැන්ගෙයි රාජකාරියෙන් නිදහස් කරනු නොලැබිය යුතුය. මන්දයත්, මේ සේවාව මගින් සහෝදර දයාව වැඩිදියුණු වීමේ විපාකය අයත්වන බැවිනි.”</u>** ***<u>(බෙනඩික් තුමන්ගේ නීතිය 35 පරිච්ඡේදය)</u>***


**අපගේ වාසස්ථාන සැමවිට සැබෑ දෙවියන් වහන්සේගේ ගෘහයන් බවට පත්විය යුතුය.එහි වසන කිසිවෙක් කිසිවිටක කරදරයට හා දුකට පත් නොවිය යුතුය. එසේම එය නිසි අයුරින් කළමණාකරණය කළ යුතුය. මෙය සාන්ත බෙනඩික් තුමන් පවසන පරිදි දෙවියන් වහන්සේ ඉදිරියේ ඉතා උතුම් හා පුණ්‍යවන්ත කැපවීමකි. තවදුරටත් යාච්ඤාව දේව වචනය අධ්‍යයනය කිරීම හා ගායනය කිරීම මත පදනම් වූවක් පමණක් නොව දේවස්ථානය, ආරාමය, නිවසේ යච්ඤා ගෘහය මෙන්ම නිවසද සැමවිටම පිරිසිදුව හා පිළිවලට තබා ගත යුතුය.**

**පැවිදි ආරාමයන්ට පැමිණෙන අමුත්තන්ට, මෙම ක්‍රියාකාරකම් වලට උපකාර කරමින් හා ඒවා අධ්‍යයනය කිරීම මගින් තම නිවාස තුළද ඒවා අනුගමනය කිරීමට හැකියාව ඇත.**

**යාච්ඤා ජීවිතය හෙවත් අධ්‍යාත්මික ජීවිතය මෙන්ම අපගේ බාහිර ජීවිතය ඉහත සඳහන් කළ අයුරින් සකසා ගැනීම තුළ ඉතාමත් ප්‍රසන්න හා කාගේත් ආකර්ෂණීය හිමි දෙවියන් වහන්සේ වැඩ සිටින දේව ගෘහයක් වනවා නොඅනුමානය. එවිට නිවසට පැමිණෙන අමුත්තන් නිසැකව මෙසේ පවසාවී: " ඔහු බියවී, "මේ ස්ථානය කෙතරම් බියකරුද? මෙය අනෙකක් නොව දෙවියන් වහන්සේගේ ගෘහයකි; මෙය ස්වර්ගයේ දොරටුව ය"යි පැවසීය" *(උත්පත්ති 28:17).***







## ආහාරය: සාම්ප්‍රදායික චාරිත්‍රයක් සහ පොදු කැපවීමකි.


වර්ථමානයේ ක්ෂණික ආහාර වලට මුල්තැන දෙන පවුල් සංස්ථාව තමන් ප්‍රිය කරන දේ ක්ෂණයකින් සාදාගෙන ආහාරයට ගැනීමට පුරුදුව සිටී. ඊට හේතුව වී ඇත්තේ පවුලේ සාංඝික එකමුතුකමට වඩා තමන්ගේ පෞද්ගලික රාජකාරීන්, අධ්‍යාපන කටයුතු, හා ක්‍රීඩා වැනි අමතර ක්‍රියාකාරකම් සඳහා කාලය වැඩි වශයෙන් යොමු කිරීමය. නූතන බොහෝමයක් පවුල් ආහාර අනුභව කරන අවස්ථාවේ එකට සිටියද, බොහෝවිට රූපවාහිනිය ක්‍රියාත්මක කොට ඇත. නැතිනම් පියා පසෙකටවී පුවත්පතක් හෝ තම රාජකාරී කටයුතුවල නිරත වෙයි, දරුවන් ජංගම දුරකතන සමග සම්බන්ධවී සිටියි. එමගින් තම තමන්ගේ පෞද්ගලික ඕනෑපාකම් සමග කටයුතු කරයි. නමුත් දෙවියන් වහන්සේ අප සැම වෙනුවෙන් සැමවිට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ජීවමනව වැඩ සිටියි.

කෙසේ වෙතත්, සාම්ප්‍රදායිකව ආහාරය හවුලේ, සාංඝිකත්වයේ සම්ප්‍රදායක් වූ අතර, එසේම පුරාතනයේ පටන් මිනිසා තම එකමුතුකමේ, හවුලේ පිළිඹිබුවක් ලෙස ආහාරය සඳහා අමුත්තන්ට ආරාධනා කළාය. නමුත් අවාසනාවන්ත ලෙස මෙම හවුලේ එකමුතුකමේ සම්බන්ධතාවය පවුල හා සාමාජයෙන්ද ඛේදජනක ලෙස යටපත් වෙමින් පවතී.

තවද, අප අපගේ හැකියාවන් දෙවියන් වහන්සේගේ තිළිණයන් විශේෂයෙන්ම ආහාර සැකසීමේ හැකියාව වඩා කායීශූර ලෙස අනෙකාගේ සුබසෙත උදෙසා යෙදවීමට එසේ කිරීමට කැපවී ජීවිත ගත කරන හා ඒ පිළිබඳව දන්නා අයගෙන් ආදර්ශයන්, මගපෙන්වීම ලබා ගත යුතුය.




**තවද පුරුෂ පැවිදිවරුන් පවා එසේ තම සංඝයට අවශ්‍ය ආහාර සකසා ගැනීමට ඉගෙනගෙන සිටිය යුතුය. සාම්ප්‍රදායික පැවිදි සාංඝික ස්වාභාවය අදටත් බෝහෝ ස්ථානවල රක්ෂාවී ඇත. කාල සටහනකට අනුව කටයුතු කිරීම, නිශ්ශබ්දතාවය රක්ෂා කිරීම, අධ්‍යාත්මික පොත පත කියවීම, සාංඝික බැඳීම, වගකීම් නිසි අයුරින් ඉටු කිරීම හා යාච්ඤාවේ ජීවිතය අදටත් දැක ගත හැකිය. මෙම පැවිදි සාංඝික ජීවිතය නූතන පවුල් ජීවිතයටද පරමාදර්ශයකි.**




LA BIBBIA




## නිවසෙහි වැඩ කිරීම සහ නිවසින් පිට වැඩ කිරීම.

නිවසෙහි වැඩ කිරීම හුදෙක් පිරිසිදු කිරීම්, සේදීම්, ඉවුම් පිහුම් හෝ වෙනත් සේවාවන් පමණක් නොව ඊට එහා ගිය පවුලේ සියළුම සාමජිකයින්ට කැපවුණු රාජකාරීන් ඇත. නිවසේ ගෘහනිය හෙවත් මව පමණක් නොව, ඒ සඳහා සියල්ලන් එකමුතුව කටයුතු කළ යුතුය. දෙවියන්ගේ වසන තම ගෘහය අලංකාර කිරීම, ප්‍රයෝජනවත්, ලාභදායී අත්කම් නිර්මාණය, තම දරුවන් අධ්‍යාපනිකව හා අධ්‍යාත්මීකව ගොඩ නැගීම, පොදු සුභසෙත සඳහා කැපවීම හා ඉතිරිකිරීම් සඳහා යොමු වීමද ඒ අතර කැපවුණු රාජකාරීන් වේ.


ඉඩම් හිමි අයට ආරාමීය පැවිදිවරුන්ගේ කඩිසරකම අනුකරණය කළ හැකිය. ඔවුන් මධ්‍යතන යුගයේ පමණක් නොව අදටත් තම ආරාමීය වතුපිටිවල එළවළු, පළතුරු වගා කරමින් හා වතු සහ උද්‍යාන රැකබලා ගනිමින් ජීවත් වේ. වැඩිහිටියන් හා තරුණ ප්‍රජාව අද වැඩි වැඩියෙන් ශරීර සුවතා මධ්‍යස්ථානවලට යොමුවී ඇත. නමුත් නූතන පරිසර විද්‍යාවේ දියුණුවත් සමග අපට දෙවියන් වහන්සේ ලෝකය මවා අපට එය වර්ධනය කරමින් රැකබලා ගැනීමට කළ ආයාචනයද සිහිපත් කරමින් අපගේ ඉඩකඩම් කෘෂිකාර්මික කටයුතු සමග සශ්‍රීක කිරීමට කැපවිය යුතුය. එමගින් දේව මැවිල්ලටත්, අපගේ එදිනෙදා ජීවිතයටත්, අපගේ ශරීර සෞඛ්‍යටත් වාසි රැසක් උරුම කර ගත හැකිය.











F. VEROLA



NAVI DA GUERRA
F. VEROLA






F.VEROLA


F.VEROLA


F.VEROLA


F.VEROLA

<u>අධ්‍යාපනය හා පුහුණුව</u>

පාසල තමා හා අනෙක් අය සඳහා අධ්‍යාපනය හා ඒ සඳහා කැපවීම සඳහා පමණක් වෙන් කර ඇති බව අප විශ්වාස නොකළ යුතුය. නමුත් පාසල නිසැකවම වැදගත් ස්ථානයකි. නමුත් අද අධ්‍යාපන ක්ෂේත්‍රය ඇතැම් ප්‍රවනතා නිසා පාසල් අධ්‍යාපනය බරපතල පරිහානියකට පත්ව ඇත. මෙම හේතුවද පදනම් කරගෙන පවුල විසින් ලබා දිය යුතු පුහුණුව ඉතාමත් වැදගත්ය. පවුල තුළ ලබාදෙන එම අධ්‍යාපනික හා අධ්‍යාත්මික මගපෙන්වීම සඳහා දහම් පාසලද සැලකිය යුතු සහයක් ලබාදේ.

අප දැක ඇති පරිදි, ඉතා විශිෂ්ඨ කෘති තුළින් ඒ සඳහා වෙහෙසවූ අයගේ කැපවීම හා පාඨකයාගේ ආත්මය ස්පර්ශ කිරීමට ගත් උත්සහය පැසසිය යුතුමය. එවන් කර්තව්‍යකට මත්තෙන් එම පුද්ගලයා යහ ගුණධර්මවලට අමතරව අධ්‍යයනය හා කියවීම තුළින් මනස එක්තැන් කර ගත යුතුය. විද්‍යාව, තාක්ෂණය, ආගම දහම යන සංකල්පයන් මානව දක්ෂතාවය පිළිඹිබු කිරීමට හොඳම මාධ්‍යයන් වේ. අවාසනවකට මෙන් නූතන සංවර්ධන සංග්‍රාමයත් සමග තරුණ, නව යොවුන් සහ ළමා පරපුර සන්නිවේදන මාර්ගයන් සමග පහත් පරිහානියකට ලක්ව ඇත. ඔවුන්ගේ නිර්මාණ ශක්තිය එමගින් හීන කර ඇත.

අපගේ නිවාස දේව ගෘහයක් බවට පත් කර ගැනීමට නම්, පවුලක් ලෙස මේ නූතන සන්නිවේදන සංග්‍රාමයට එරෙහිව කටයුතු කළ යුතුය. නමුත් ඉන් ලබාගත හැකි ප්‍රයෝජනවත් දේද ඇති බව අප වටහා ගත යුතුය. පළමුවෙන්ම ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය භාවිතය ඉතා සීමිත කළ යුතු අතර දරුවන් නිසි වයසට පැමිණෙන තුරු ඒවා ඔහුන්ගේ භාවිතය සඳහා යොමු නොකළ යුතුය. රූපවාහිනිය, පොත්පත්, සඟරා ආදිය තුළින්ද අනිසි ඇබ්බැහිවීම් වලට දරුවා යොමුවිය හැකිය. එම නිසා දෙමාපියන් ඒ පිළිබඳව බුද්ධිමත් හා දැනුවත් විය යුතු අතරම එමගින් නිවෙස වටා ඇති නොපෙනෙන අහිතකර බලවේග වලට එරෙහිව කටයුතු කිරීමට හැකියාද ලැබේ.

නමුත් නූතන සන්නිවේදනයේ තාක්ෂණයේ මේ සෑම අහිතකර බලපෑමක්ම සමග හිතකර බලපෑමක්ද ඇතිකළ හැකිය. එය අපගේ නිවස වටා සෘණාත්මක පණිවිඩ පමණක් නොව ධනාත්මක පණිවිඩද සම්ප්‍රේෂණය කරයි. විද්‍යුත් රූප රාමු, වීඩියෝ, පොත පත කියවීම, අධ්‍යාපන පහසුකම්, සංගීතය, කාලාව, ක්‍රීඩා හා විනෝදාත්මක ක්‍රියාකාරකම් අපගේ සහ දරුවන්ගේ ජීවිතවලට ධනාත්මක බලපෑමක් එල්ල කිරීමටද හැකියාව ඇත. එය තීරණය වන්නේ අප ඒවා භාවිතා කරන ආකාරය අනුවය.


අතීතයේ නොතිබූ බොහෝමයක් අවස්ථාවන් අද අන්තර්ජාලය තුළින් අපට ලබා ගත හැකිය. විශේෂයෙන්ම එය සංස්කෘතිය, කලාව, සංගීතය හා ආගම දහම වඩා පුළුල්ව අධ්‍යයනය කිරීම සඳහා කදිම මෙවලමකි.


තවද, අප පගේ නිවෙස් තුළ කුඩා පුස්තකාලයක් නිර්මාණය කළ යුතුය. එමගින් කුඩා දරුවන්ට හා නව යොවුන් වියේ පසුවන දරුවන්ටද සංස්කෘතිමය,


සාහිත්‍යමය, කලාත්මක, අධ්‍යාපනිකව හා අධ්‍යාත්මිකව ඉතා විශිෂ්ඨ වර්ධනයක් ලඟා කර ගත හැකිය. අපගේ පවුල මෙවන් වටිනා පුස්තකාලයක් සහිත නිවසක හිමිකරුවන්ද?

අන්තර්ජාලය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ප්‍රධානම ගැටළුව වන්නේ, එය භාවිතා කිරීමට මගපෙන්වීම හා අවශ්‍ය අවබෝදය ලබා ගන්නේ කෙසේද? හා එය නිසි අයුරින් භාවිතා කරන්නේ කෙසේද? යන්නයි.

එම ගැටළුව සාධාරණය. සාමාන්‍ය පාසල් විෂය මාලාවෙන් ඔබ්බට ගිය අධ්‍යාපනයේ අවශ්‍යතාවයක් ඇති බවත්, එය ආගමික ප්‍රජාව (පැවිදි සංඝයන් හා පූජකයින්) විසින් සැපයිමට මැදිහත් විය යුතු අතරම පසුව එය තම දරුවන් වෙත ලබා දීමට දෙමාපියන් කැපවිය යුතුය. මෙම මගපෙන්වීම ලබා දීමට පල්ලියේ පූජක තුමන් හා පැවිදි ප්‍රජාව බොහෝසේ මැදිහත් විය යුතුය. ඒ සඳහා පූජක, පැවිදි සියල්ලන් ආගමික හා මානව දැනුම හා දැනුවත්කම ලබා සිටිය යුතුය.




ORA ET LABORA
F.VEROLA


INRI
GIOVANNI PAOLO II
LA DIVINA COMMEDIA
F.VEROLA


S. AGOSTINO
LE CONFESSIONI
F. VEROLA


A. MANZONI
I PROMESSI SPOSI
F. VEROLA

# ප්‍රබෝද්දමත් හා හිතකර අවස්ථා සහ විවේකය

කලාව, සංගීතය, සුන්දර හා අර්ථාන්විත සංදර්ශන අධ්‍යාපනික ක්ෂේත්‍රයේ කොටසක් පමණක් නොව, එය දවසක් නිම කර රාත්‍රී නින්දට යාමට පෙර මනස සැහැල්ලු කරගැනීමට හා යහපත් නිමාවක් සමගින් නිසි නින්දක් ලබා ගැනීමට උපකාර වේ. නමුත් අවාසනාවකට මෙන් මෙම දේවල් මගින් හානිකර පුරුදුවලට මිනිසා ඇබ්බැහි වී ඇත. වඩාත්ම සුළබ විනෝදාස්වාදය බොහෝ විට තරුණ හා ළමා ප්‍රජාව අතර දූෂිත වන්නේ අසභ්‍ය හා නරක අන්තර්ගතයන් සමග එය ගලපා ගැනීම හේතුකොට ගෙනය. මෙයට ප්‍රධාන හේතුව වන්නේ පවුල් සම්බන්ධතාවයන්ගෙන් ඈත්වී, තමන්ව පාලනය කර ගැනීමට නොහැකි වීම හා මමත්වය තුළ ජීවත් වීමය. බොහෝවිට අප සවස් කාලය නිවසින් බැහැරව අනවශ්‍ය විනෝදාස්වාදයන් ලබා ගැනීමට පුරුදුව සිටී. එමගින් සෞඛ්‍ය සම්පන්න රාත්‍රී නින්දක ලබා ගැනීමේ හැකියාව මෙන්ම පවුල් සම්බන්ධතාවයන්ද අවහිර කරයි.


මේ සියල්ලෙන්ම වැළකීමට හැකි වන්නේ සැබෑ කලාවේ සහ සංගීතයේ සාමය, සුන්දරත්වය හා අර්ථාන්විතභාවය සොයා ගැනීම හා විනෝදාස්වාදය තම පවුලේ, සංසයේ සාමාජිකයින් සමග ඒකරාශීවී ලබා ගැනීමට උත්සුක වීම තුළය. සවස් වරුවේ සෞඛ්‍ය සම්පන්න විනෝදාස්වාදයක ලබා ගැනීමට පවුලේ අය සමග එක්වී ප්‍රීතිවීමටත්, යාච්ඤාවකින් දවස නිම කර සාමයෙන් හා නිහඬව ප්‍රමාද නොවී පැවිදි සංසයන්ගේ නීතිරීති මෙන් රාත්‍රී නින්දට යාමට පුරුදු විය යුතුය.

නවීන විද්‍යුත් මාධ්‍යයන් පවා නිසි අයුරින් භාවිතා කර විවේකී අවස්ථාවල විනෝදාස්වාදය ප්‍රතිලාභදායක අත්දැකීම් වලින් පොහොසත් කර ගැනීමට සැළකිය යුතු දායකත්වයක් ලබා දෙයි. ඒ සඳහා පැවිදි ප්‍රජාවගේද සහය හා මගපෙන්වීම ගිහි ජනතාව උදෙසා ලබා දිය යුතු අතරම ඒ සඳහා ඔවුන්ද පුරුදු පුහුණු වී සිටිය යුතුය.






MOZART






<u>යහපත් පවුල් පරිසරය ආරක්ෂා කර ගැනීම.</u>


සාන්ත බෙනඩික්ට් තුමන් තම නීතිය තුළද පෙන්වා දුන්නේ ආරාමයෙන් පිටත්වන තාපසවරුන් විශේෂ ආශිර්වාදයක් ලබා ගැනීමට හා සාංඝික සාමාජිකයින්ගේ යාච්ඤා මධ්‍යස්ථකම තුළ ඒ ගමන යා යුතු බවයි. මන්දයත්, ආරාමය තුළ සිටින තාක් එම තාපසයා දෙවියන් වහන්සේගේ ගෘහය තුළ ජීවත් වන අතරම, ඉන් පිටතදී ලෝකයේ පාපිෂ්ඨ ස්වාභාවයන් සමග යම්කිසි ඒකබද්ධ වීමකට ලක් විය හැකි බව එතුමන්ට වැටහී තිබූ බැවිනි. මේ හේතුව නිසාවෙන් සැම විටම පැවිද්දා තමන් අයිති ස්ථානය වටහාගෙන, ඉන් බාහිර ලෝකය තුළ තමන්ට පැවරුණ මෙහෙවර ඉටු කළ පසු, නැවත තම සංඝය වෙත යාමට ඉක්මන් විය යුතුය.

එසේම පවුලේ සාමාජිකයින්ද, විශේෂයෙන් බාලයන්ට විශේෂ අවධානයක් ආරක්ෂාවක් ලබා දිය යුතු අතර, දෙවනුව තම පවුලට ආදරය කිරීමට ඔවුන් හුරු කළ යුතුය. දෙවියන් වහන්සේගේ ගෘහය මෙන් එහි කිසිවෙක් දුකට හෝ කරදරයට පත් නොවී දේව ආශිර්වාදය හා රැකවරණය තුළ බලගැන්විය යුතුය.

මේ හේතුව නිසාවෙන් දෙවියන් වහන්සේගේ ගෘහයේ ජීවිතය ප්‍රීතිමත් හා ආදරණීය වේ. සැම කෙනෙකුම තමන්ට පැවරුණු වගකීම් අවංක හදවතින් ඉටු කිරීමට

**කැපවී සිටීම නිසා සෑම දෙයක්ම නිසි පරිදි හා නියමිත වේලාවට සිදු වේ.තවද නිවස තුළද නියමිත මොහොතේදී, කාලයේදී සියල්ල සිදුවුවහොත් එමගින් අර්ථාන්විත හා ආදර්ශමත් පවුලක් හෙවත් දේව ගෘහයක් බවට අප පවුලද පත් කර ගත හැකිය.**






## <u>ගෘහ භාණ්ඩ සහ ඇඳුම් පැළඳුම්</u>


සාන්ත බෙනඩික් තුමන් දෙවියන් වහන්සේගේ ගෘහය තුළ ජීවිතය හොඳින් නියාමනය කිරීම සඳහා මෙම අංග (ගෘහ භාණ්ඩ හා ඇඳුම් පැළඳුම්) මූලික වන ආකාරය පෙන්වාදී ඇත.


දෙවියන් වහන්සේගේ ගෘහයේ බාහිර ස්වාභාවය හා අලංකාරය එහි ජීවත්වන අයවළුන්ගේ ජීවිත රටාව පිළිඹිබු කරයි. සියවස් ගණනාවක් පුරා තාපසයින් තම දේවස්ථාන පමණක් නොව ආරාම, පෞද්ගලික කුටි පවා පූජනීය රූප හා මූර්තිවලින් අලංකාර කොට ඇත්තේ මේ නිසාමයි. ඒ හා සමානව ඔවුන් පැළඳ සිටි රෙදි පිළි පවා ඔවුන්ගේ ජීවිතයේ පාරිශුද්ධභාවය සිහිගන්වන ලදි.

මෙම ආරාමීය උදාහරණ මගින් පවුල්වලට ඔහුන්ගේ නිවාස, පොදු හෝ පෞද්ගලික වාසස්ථාන අලංකාරව, ආකර්ශනීය මෙන්ම අධ්‍යාත්මික ප්‍රීතියක් ඇති කරන ස්ථාන බවට පත්කර ගත හැකිය. නිසි අයුරින් ගෘහ භාණ්ඩ ස්ථානගත කිරීම හා ආගමික හා සංස්කෘතික රූපරාමු නිසි ස්ථානයන්හී රැඳවීම තුළ පරිපූර්ණ හා අධ්‍යාත්මික හැඟීම් උත්දීපනය කිරීමට හැකිය. තවද සංවර හා ක්‍රමානුකූලව නිපැයූ ඇඳුම් පැළඳුම් පැළදීම තුළ සමාජයට අපගේ ජීවිත රටාව පිළිඹිබු කළ හැකිය.










## පුණ්‍ය කටයුතු

අප දෙවියන් වහන්සේගේ ගෘහයේ අභ්‍යන්තර ජීවිතය අත්දකින්නේ පවුලේ සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් හා අගහිඟකම් වලට සමීප වීම තුළ පමණකි. නමුත් අප එසේම සමාජයේ ජීවත්වන අනෙක් අයගේ ගැටළුවලට විවෘත නොවන්නේනම් දෙවියන් වහන්සේගේ ගෘහය තුළ කුමන ආකාරයේ කිතුණු සැකැස්මක් වර්ධනය වන්නේද?

සාන්ත බෙනඩික් තුමන්ගේ ඉගැන්වීම්වලට අනුව කිසියම් ගැටළුවක් කිසි විටෙකත් පුද්ගලයෙකුගේ ජීවිතයට පමණක් සම්බන්ධ නොවන අතර එය ඔහුගේ/ඇයගේ මුළු පවුලටම සහ සමාජ කණ්ඩායමටම බලපෑම් කරයි. මෙයට හොඳම පිළියම වන්නේ, පවුල් ජීවිතය හා ඒ හා බැඳුණු ජීවිත සුවපත් කිරීමයි. සාන්ත බෙනඩික් තුමන්ගේ නීතිය සහ ආරාමීය ජීවිත ක්‍රමය විසින් දෙන ලද ආදර්ශයන් හා ඉගැන්වීම් අනුව වර්තමාන නපුරේ බලවේගයන්ට එරෙහිව කටයුතු කිරීමට මඟ පෙන්වයි.

නපුරේ බලය රජකරන ස්ථානයක වුවද, හොඳම රැකවරණය වනුයේ, අවශ්‍යතාවල සිටින දුක්විඳින ජනතාවගේ මුළු පවුල් ජීවිත දේව ආලෝකය තුළ සුවපත් කිරීමය. මෙහිදී තනි සාමාජිකයන් පමණක් නොව, අධ්‍යාත්මිකව ශක්තිමත් තත්වයේ සිටින පවුල් එක්ව නපුරේ බලයට නතුව ඇති පවුල වෙත නැවත දේව ආදරය හා සාමය ගෙන ඒමට අවශ්‍ය බාහිර හා අධ්‍යාත්මික සහයෝගය ලබා දිය යුතුය. එවිට එසේ නැවත ගොඩනැගෙන පවුලට අනෙක් නපුරේ බලයට යටවී සිටින පවුල් නැවත ගොඩනැගීමට හැකියාව ඇත. සාන්ත බෙනඩික් තුමන්ගේ හා ආරාමීය පැවිදිවරුන්ගේ මගපෙන්වීම තුළ මෙම දයාවේ සේවාවන් තවත් පුළුල්ව අසරණව සිටින පවුල් වෙත ගෙන යන්නට අවස්ථාව හිමිවේ.



## සම වගකීම

සාන්ත බෙනඩික් තුමන් ආරාමයේ යම්කිසි ගැටළුවක් උත්ගත වුවහොත් එය සාකච්ඡා කිරීමට ආරාමාධි තුමන් සංඝයේ අනෙක් ප්‍රජාව කැඳවිය යුතු අතර, තීරණයක් ගැනීමට මත්තෙන්, ඔහු සැම දෙනාගේම, බාලම සාමාජිකයාගේ පවා මතයට සවන් දිය යුතු බව තම නීතියේ අඩංගු කර ඇත.

සාන්ත බෙනඩික් තුමන්ගේ නීතිය අනුව සියළුම පැවිදිවරුන්ට ආරාමයේ සම-වගකීම් දැරීමට ආරාධනා කර ඇත. නිදසුනක් වශයෙන්, ආරමයේ ඇති සැම භෞතික වස්තුවක්ම ආරක්ෂා කිරීමට සැම සාමාජිකයෙක්ටම වගකීමක් ඇත. තවද එම සැම භෞතික වස්තුවක්ම ලේඛණගත කොට ඒවා නැතිවීමකට හෝ නාස්තියට භාජනය නොකළ යුතු බව පවසා ඇත.

පවුලක සාමාජිකයින්ද මෙසේ තම නිවසේ බඩු භාහිරාදිය හා ඒවා පාලනය හා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් විශාල අවධානයක් යොමු කළ යුතුය. මෙමගින් පවුලේ අනවශ්‍ය වියදම් වළක්වා ගැනීමට හා එමගින් අනෙකාට උපකාර කිරීමටද හැකියාව ලබා ගත හැකිය.

පැවිදි සංඝයේ සියල්ලන් එකමුතුව ගැටළුවලට මුහුණ දීමට හා ඒවාට විසඳුම් සෙවීමට උත්සුක වන්නේ නම් සාන්ත බෙනඩික් තුමන් පෙන්වා දුන් එම නිවැරදි ආරාමීය පැවැත්ම ජීවමාන කළ හැකිය. එසේම නූතන පවුල්වලටද තනි තනිව ගැටළුවලට මුහුණ නොදී පවුලක් ලෙස එකමුතුව, සියල්ලන්ගේ මතයන්ට ගරු කරමින් ඒවාට මුහුණ දිය යුතුය. එමගින්ද අප පවුල් දේව ගෘහයන් බවට පත්කර ගත හැකිය.

